# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 43 දරන
# පිරිවැටුම් බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 නොවැම්බර් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 නොවැම්බර් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 90 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1990 අංක 43 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 නොවැම්බර් මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 69/89

## 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1990 අංක 43 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1981 අංක 69 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (ඇ) ඡේදයේ "රක්ෂණ ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලබන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් ලබා ගන්නා ලද හෝ ලබාගත හැකි, වාර මුදල් හැර මුළු මුදල් ප්‍රමාණය ඇතුළත් වේ" යන වචන වෙනුවට "රක්ෂණ ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලබන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට,—

(i) ජීවිත රක්ෂණය ; සහ

(ii) වැඩ වර්ජනයකින්, කැරැල්ලකින්, මහජන කැළඹීමකින් හෝ ත්‍රස්තවාදී ක්‍රියාවලින් සිදු වූ අලාභවලට හෝ විනාශයට ප්‍රතිපක්ෂව වැඩ වර්ජනය, කැරැල්ල සහ මහජන කැළඹීම සහ ත්‍රස්තවාදය වෙනුවෙන් ආණ්ඩුවේ අර මුදලට ගෙවන ලද රක්ෂණය

සම්බන්ධයෙන් ලබා ගන්නා ලද හෝ ලබා ගත හැකි වාර මුදල් හැර, මුළු මුදල් ප්‍රමාණය ඇතුළත් වේ ; තව ද

(ආ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "එසේ නමුත් ඒ බැංකුවේ විදේශ මුදල් බැංකු ඒකකය පවත්වා ගෙන යාමට අදාළ කළ හැකි ලැබීම් ඊට ඇතුළත් නොවිය යුතු ය." යන වචන වෙනුවට "එසේ නමුත්—

(i) ඒ බැංකුවේ විදේශ මුදල් බැංකු ඒකකය පවත්වාගෙන යාමට ; සහ

(ii) වෙනත් යම් බැංකුවක් සමග 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ බැංකුව ඇතුළත් වන යම් ගනුදෙනුවකට

ආරෝපණය කරනු ලැබිය හැකි ලැබීම් ඊට ඇතුළත් නොවිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

" (5) භාණ්ඩ සෑදීමේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යම් කාර්තුවක් සඳහා වූ පිරිවැටුම නිශ්චය කිරීමේ දී ඒ ව්‍යාපාරය කරගෙන යන තැනැත්තා විසින් ඒ භාණ්ඩය සම්බන්ධයෙන්, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙවනු ලැබූ යම් තීරු බදු ගාස්තුවකට සමාන මුදලක් අඩු කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද යම් කාර්තුවක් සඳහා එසේ අඩු කරනු ලැබිය යුතු මුදල භාණ්ඩ සෑදීමේ ඒ ව්‍යාපාරය කරගෙන යන අතරතුර යම් භාණ්ඩයක් විකිණීමෙන් ඒ කාර්තුව සඳහා ලැබුණ හෝ ලැබිය යුතු මුදල ඉක්මවන අවස්ථාවක, ඒ අතිරික්තය ඒ කාර්තුවට ඉක්බිතිවම ඊළඟෙන කාර්තුවට ගෙනයා යුතු අතර, එම ඉදිරි කාර්තුව සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම් නිශ්චය කිරීමේ දී අඩු කරනු ලැබිය යුතු ය. තව ද යම් ශේෂයක් වෙතොත්, ඉහත කී ආකාරයෙන් ඉදිරියට ගෙන ගොස් අඩු කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" ලියාපදිංචි කළ සාදන්නා විසින් කරනු ලබන අඩු කිරීම.

47. යම් කාර්තුවක් තුළ ඇතුළත් වූ යම් ගණුදෙනුවක් සම්බන්ධයෙන් යම් ලියාපදිංචි සාදන්නකු විසින් ඔහුගේ භාණ්ඩ සෑදීමේ ව්‍යාපාරයේ දී පාවිච්චි කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් පිරිවැටුම් බද්දක් ඇතුළත් වන යම් මුදලක් වෙනත් ලියාපදිංචි සාදන්නකුට ගෙවා ඇති අවස්ථාවක, එසේ ඇතුළත් කරනු ලැබූ පිරිවැටුම් බද්ද පළමු සඳහන් ලියාපදිංචි සාදන්නා විසින් සාදන ලද භාණ්ඩ විකිණීමෙන් උද්ගත වන පිරිවැටුම සම්බන්ධයෙන් ඔහු විසින් ඒ කාර්තුව සඳහා ගෙවිය යුතුවන යම් පිරිවැටුම් බද්දකින් අඩු කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද—

(අ) (i) ඒ ව්‍යාපාරයේ දී පාවිච්චි කරනු ලැබූ යම් පිරියතක්, යන්ත්‍රෝපකරණයක්, තීරවුරු, ගොඩනැගිලි හෝ වෙනත් ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් ;

(ii) නිදහස් කළ භාණ්ඩ සෑදීමේ යම් ව්‍යාපාරයක දී පාවිච්චි කරනු ලැබූ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් 1980 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් කාර්තුවක් සඳහා ;

(iii) 4 වන වගන්තිය යටතේ පිරිවැටුම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇත්තා වූ යම් ව්‍යාපාරයක දී පාවිච්චි කරනු ලැබූ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ;

(iv) ඒ මුදල ලැබුවා වූ දෙවනුව සඳහන් ලියාපදිංචි සාදන්නාගෙන් පළමුව සඳහන් ලියාපදිංචි සාදන්නා විසින් 46 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති පරිදි, වවුචරයක් ලබාගෙන ඇත්නම් මිස

එසේ ගෙවන ලද යම් මුදලක ඇතුළත් කරනු ලැබූ පිරිවැටුම් බද්දක් සඳහා කිසිම අඩු කිරීමක් කරනු නොලැබිය යුතු ය.

(ආ) ලියාපදිංචි සාදන්නකු වශයෙන් තමාගේ ලියාපදිංචියට පෙරාතුව යම් තැනැත්තකු විසින් එසේ ගෙවන ලද යම් මුදලක ඇතුළත් කරනු ලැබූ යම් පිරිවැටුම් බද්දක්, ඔහු විසින් සාදන ලද භාණ්ඩ විකිණීමෙන් උද්ගත වන පිරිවැටුම සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද අය කර ගනු ලැබීමට ඔහු යටත් වන්නා වූ කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් අඩු කර ගැනීමක් වශයෙන් ඉඩ දෙනු ලැබිය යුතු ය ; තව ද

(ඇ) (i) 1989 මාර්තු 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් කාර්තුවක් සඳහා වූ අඩු කර ගැනීමේ මුදල, ඒ පිරිවැටුම සම්බන්ධයෙන් එම කාර්තුව සඳහා පළමුව සඳහන් ලියාපදිංචි සාදන්නා විසින් ගෙවිය යුතු පිරිවැටුම් බදු මුදල ඉක්මවන අවස්ථාවක, ඒ අතිරික්තය ආපසු ගෙවනු නොලැබිය යුතු ය. එහෙත්

ඒ කාර්තුවට ඉක්බිතිවම එළඹෙන කාර්තුව සඳහා ඔහු විසින් ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන්, අඩු කර ගනු ලැබිය හැකි ප්‍රමාණයට ඒ අතිරික්තය අඩු කර ගනු ලැබිය යුතු අතර ඉන්පසුව ඒ අතිරික්තයෙන් යම් ශේෂයක් වෙතොත් ඊළඟට එළඹෙන කාර්තුව යනාදී වශයෙන් වූ කාර්තු සඳහා ඔහු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් ඒ ශේෂය අඩු කර ගනු ලැබිය යුතු ය; තව ද

(ii) 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් කාර්තුවක් සඳහා වූ අඩු කර ගැනීමේ මුදල, ඒ පිරිවැටුම සම්බන්ධයෙන් එම කාර්තුව සඳහා පළමු සඳහන් ලියාපදිංචි සාදන්නා විසින් ගෙවිය යුතු පිරිවැටුම් බදු මුදල ඉක්මවන අවස්ථාවක, ඒ කාර්තුවට ඉක්බිතිව ම එළඹෙන කාර්තුව සඳහා ඔහු විසින් ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් අඩු කර ගනු ලැබිය හැකි ප්‍රමාණයට ඒ අතිරික්තය අඩු කර ගනු ලැබිය යුතු අතර, අතිරික්තයෙන් යම් ශේෂයක් වෙතොත්, ඊළඟට එළඹෙන කාර්තුව යනාදී වශයෙන් වූ කාර්තු සඳහා වූ ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ඔහු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් ඒ ඒ ශේෂය අඩු කර ගනු ලැබිය යුතු ය. ඒ අතිරික්තය උද්ගත වූ කාර්තුවේ සිට ගණන් බලනු ලැබූ හතරවන කාර්තුව සඳහා ඔහු විසින් ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ පිරිවැටුම් බද්දෙන් අඩු කර ගනු ලැබිය නොහැකි ඒ අතිරික්තයෙන් වූ යම් ශේෂයක්, 49 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ආපසු ගෙවනු ලැබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

ඉර්ගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවන ලද පිරිවැටුම් බද්ද අඩු කිරීම.

48. භාණ්ඩ සෑදීමේ තම ව්‍යාපාරයේ දී යම් ලියාපදිංචි සාදන්නකු විසින් පාවිච්චි කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන්, යම් කාර්තුවක් තුළ, පිරිවැටුම් බද්දක් ඒ සාදන්නා විසින් 12 වන වගන්තිය යටතේ ඒගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවා ඇති අවස්ථාවක, ඒ පිරිවැටුම් බද්ද, ඔහු විසින් සාදන ලද භාණ්ඩ විකිණීමෙන් උද්ගත වන පිරිවැටුම සම්බන්ධයෙන් ඒ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවිය යුතු යම් පිරිවැටුම් බද්දකින් අඩු කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද—

(අ) (i) ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලබන යම් පිරියතක්, යන්ත්‍රෝපකරණයක්, තිරවුරු, වාහන, ගොඩනැගිලි හෝ වෙනත් ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් ;

(ii) නිදහස් කරන ලද භාණ්ඩ සෑදීමේ යම් ව්‍යාපාරයක දී පාවිච්චි කරන ලද යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් 1989 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාර්තුවක් සඳහා ;

(iii) 4 වන වගන්තිය යටතේ පිරිවැටුම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇත්තා වූ යම් ව්‍යාපාරයක දී පාවිච්චි කරනු ලැබූ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ; සහ

(iv) එසේ ගෙවන ලද පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් ලියාපදිංචි සාදන්නා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් වවුචරයක් ලබා ගෙන ඇත්නම් මිස

එසේ ගෙවන ලද යම් පිරිවැටුම් බද්දක් සඳහා කිසිම අඩු කිරීමක් කරනු නො ලැබිය යුතු ය ; සහ

(ආ) (i) 1989 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් කාර්තුවක් සඳහා අඩු කරන මුදල ඒ පිරිවැටුම සම්බන්ධයෙන් එම කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බදු මුදල ඉක්මවන්නා වූ අවස්ථාවක, ඒ අතිරික්තය ආපසු ගෙවනු නොලැබිය

යුතු ය. එසේ වුව ද ඒ කාර්තුවට ඉක්බිතිවම එළඹෙන කාර්තුව සඳහා ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ ඒ පිරිවැටුම් බද්දෙන් අඩුකර ගනු ලැබිය හැකි ප්‍රමාණයට ඒ අතිරික්තය අඩු කරගනු ලැබිය යුතු අතර, ඉන් පසු ද ඒ අතිරික්තයෙන් යම් ශේෂයක් වේ නම්, ඊළඟට එළඹෙන කාර්තුව යනාදී වශයෙන් වූ කාර්තු සඳහා ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ඔහු විසින් ගෙවිය යුතු වූ පිරිවැටුම් බද්දෙන් ඒ ශේෂය අඩු කරගනු ලැබිය යුතු ය; තව ද,

(ii) 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් කාර්තුවක් සඳහා අඩු කරන මුදල ඒ පිරිවැටුම සම්බන්ධයෙන් එම කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බදු මුදල ඉක්මවන්නා වූ අවස්ථාවක, ඒ අතිරික්තය ඒ කාර්තුවට ඉක්බිතිවම එළඹෙන කාර්තුව සඳහා ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ පිරිවැටුම් බද්දෙන් අඩු කරනු ලැබිය හැකි ප්‍රමාණයට අඩු කරගනු ලැබිය යුතු අතර, ඉන් පසු ද ඒ අතිරික්තයෙන් යම් ශේෂයක් වේ නම් ඒ ශේෂය ඊළඟට එළඹෙන කාර්තුව යනාදී වශයෙන් වූ කාර්තු සඳහා ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ පිරිවැටුම් බද්දෙන් අඩුකර ගනු ලැබිය යුතු ය. ඒ අතිරික්තය උද්ගත වූයේ යම් කාර්තුවක් සඳහා ද ඒ කාර්තුවේ සිට ගණන් බලනු ලැබූ හතරවන කාර්තුව සඳහා ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ පිරිවැටුම් බද්දෙන් අඩු කරනු ලැබිය නොහැකි ඒ අතිරික්තයේ යම් ශේෂයක් 49 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ආපසු ගෙවනු ලැබිය යුතු ය.”.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියේ (4අ) උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සැපයුම්කරුට ගෙවනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "කොමසාරිස් ජනරාල් වරයා විසින් ඒ සැපයුම්කරුට ගෙවනු ලැබිය යුතු ය:" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන අතුරු වගන්තිය එකතු කිරීමෙන් :—

"එසේ වුව ද ඉහත කී ආකාරයෙන් ණයවර ලිපියක් මගින් ඒ සැපයුම ආවරණය කිරීම අවස්ථානුකූල නොවන බව හෝ කළ නොහැකි බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ලෙස ඔප්පු කරනු ලබන අවස්ථාවක, සැපයුම්කරු විසින් ගෙවන ලද පිරිවැටුම් බද්දෙහි ඒ භාණ්ඩ සෑදීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී පාවිච්චි කරනු ලැබූ අමු ද්‍රව්‍යවලට ආරෝපණය කරනු ලැබිය හැකි වත්නා වූ මුදල් ප්‍රමාණය,—

(අ) ශ්‍රී ලංකාවේ බැංකුවකින් විවෘත කරන ලද ණයවර ලිපියක් මගින් හෝ ඒ සැපයුමට අදාළ අපනයන යන් ඇත්ත වශයෙන් ම කළ බවට තමා සෑහීමට පත්වීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කෙරෙන වෙනත් යම් ලේඛනගත සාක්ෂි මගින් ඒ සැපයුම ආවරණය කරනු ලැබ ඇත්නම් ; සහ

(ආ) ඒ සැපයුමට අදාළ අපනයනවල වටිනාකම සඳහා වන විදේශ විනිමය ගෙවීම ලැබූ බව, එම විදේශ විනිමය ප්‍රේෂණය කරනු ලැබුවේ යම් බැංකුවකට ද ඒ බැංකුව විසින් සහතික කරනු ලැබ ඇත්නම්

කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සැපයුම්කරුට ගෙවිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ (4) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (iii) වන ඡේදයේ "සම්බන්ධයෙන් වූ අනු ගිවිසුමක් ; හෝ" යන වචන වෙනුවට "සම්බන්ධයෙන් වූ අනු ගිවිසුමක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි (iv) වන ඡේදයේ "සඳහා වූ යම් ගිවිසුමක්" යන වචන වෙනුවට "සඳහා වූ යම් ගිවිසුමක් ; හෝ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) (iv) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්—

"(v) නිෂ්පාදකයකු විසින් සිනමා චිත්‍රපට සැපයුම සඳහා වූ යම් ගිවිසුමක්" යන වචන එකතු කිරීමෙන් ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියේ " බලය ලත් නියෝජිතයා " යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" බැංකුව " යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍ර නිකුත් කරනු ලැබූ වාණිජ බැංකුවක් අදහස් වේ ; ".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල හා පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.